# බයිබල් ප්‍රශ්නාවලිය - 2026 සිට

## තේමාව : දෙවියන් වහන්සේ




## කාණ්ඩය : 6 හා 7 ශ්‍රේණි

සැකසීම : ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

බයිබල් දැනුම මිනුම තරඟය - ඔබගේ ප්‍රයෝජනය සඳහා

**6** ශ්‍රේණිය - තේමාව:

# විමුක්තිදායකයාණන් වන දෙවියන් වහන්සේ

| පොදු අරමුණු | ප්‍රධාන බයිබල් පරිච්ඡේද | ඉගෙනුම් ඵල | අමතර බයිබල් පාඨ | අරමුණ |
|---|---|---|---|---|
| ජෝශප් හා නික්මයාම | උත්පත්ති 37:45-47<br>නික්මයාම 7-12<br>නික්මයාම 20 | දරුවන් ඉතිහාසය හරහා දෙවියන් වහන්සේගේ විමුක්තිය දැකීම | නික් 14:14<br>නික් 6:7<br>ජොහාන් 8:36 | දෙවියන් වහන්සේ තම ජනතාව නිදහස් කරයි |
| නව මෝසෙස් වන ජේසුස් වහන්සේ | ජොහාන් 1:21,25,45<br>ක්‍රියා 3: 22-26, 7:37 | දරුවන් දෙවියන් වහන්සේගේ ගැලවීමේ පොරොන්දුව තුළ ජේසුස් වහන්සේ සම්පූර්ණ වූ බව පිළිගනියි | මතෙව් 5:7<br>ගලාති 5:1<br>ජොහාන් 14:6 | ජේසුස් වහන්සේ ප්‍රේමයේ හා ගැලවීමේ නීතිය රැගෙන ආ බව |
| විශ්වාස ලක්ෂණය | අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය හා නිසියාකු විශ්වාස ලක්ෂණය | ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මරණය හා උත්ථානය ගැන විශ්වාසයේ ගැඹුරට ගමන් කරයි | 1 කොරි 6:14<br>පිලිප් 3:20<br>ක්‍රියා 2:24 | පාපය හා මරණය අතර ගැලවීම |
| නැවත සමඟි වීමේ ප්‍රසාද නිධානය | ජොහාන් 20:23 | දරුවන් පාපයෙන් මිදීම පාපොච්චාරණය මඟින් සිදුවන බව පිළිගනියි | ගීතාවලිය 145:8<br>ක්‍රියා 3:19<br>යෙසායා 1:18 | අධ්‍යාත්මික ගැලවීම සඳහා දේව කරුණාව මඟපෙන්වයි |
| මිදීමේ යාච්ඤාව | ගීතාවලිය 135<br>නික්මයාම 15 | දරුවන් දෙවියන් වහන්සේගේ මහිමාන්විත ක්‍රියා සඳහා ප්‍රශංසා කරයි | ගීතාවලිය 136:1<br>නික් 15:2<br>ගීතා 150:6 | දෙවියන් වහන්සේගේ ගැලවීමේ ක්‍රියා සඳහා කෘතඥතාවය පළ කිරීම |



## බයිබල් දැනුම මිනුම තරඟය - ඔබගේ ප්‍රයෝජනය සඳහා

## 7 ශ්‍රේණිය - තේමාව:

# විමුක්තිදායකයාණන් වන දෙවියන් වහන්සේ

| ප්‍රධාන අරමුණ | ප්‍රධාන බයිබල් පරිච්ඡේද | ඉගෙනුම් ඵල | අමතර බයිබල් පාඨ | අරමුණ |
|---|---|---|---|---|
| දිවැසිවර පණිවුඩ | යෙසායා<br>ජෙරමියා<br>එසකියෙල්<br>දානියෙල් | දෙවියන් වහන්සේ තම වචනය මගින් විමුක්තිය ගැන පොරොන්දු වූ බව. | ගීතා 91:15<br>ගීතා 146: 7<br>ගලාති 5:1 | දිවැසිවරුන් විසින් නිදහස හා බලාපොරොත්තුව පිළිබඳව ප්‍රකාශ කළා. |
| ජේසුස් වහන්සේ තුළ සම්පූර්ණත්වයට පත්වීම | ලූක් 4:18-20<br>සුව කිරීම්<br>සකේවුස්<br>සමරිතානු ස්ත්‍රිය | ජේසුස් වහන්සේ සුවකිරීම හා සමාව දීම තුළින් විමුක්තිය උදා කළ බව විශ්වාස කරයි. | මතෙව් 11:28<br>ලූක් 19:10<br>ජොහාන් 8:36 | ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පොරොන්දුව අප ජීවිත තුළට රැගෙන එන බව. |
| විශ්වාස ලක්ෂනයේ 3 හා 5 වගන්ති | අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය | ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය මරණය හා උත්ථානය ගැන විශ්වාස කරයි. | 1 කොරි 15:3-4<br>ක්‍රියා 2:24<br>ජොහාන් 11:25 | ඇදහිල්ල ගැලවීමේ ඉතිහාසය සමග සම්බන්ධ කරන බව. |
| සක්‍රමේන්තු රෝගීන්ගේ ආලේපය | මාක් 6:13<br>ජාකොබ් 5:14-15 | දුක් වේදනා වලින් මිදීම සුවය ලෙස තේරුම් ගනියි. | නික්මයාම 15:26<br>මතෙව් 11:28<br>ගීතාවලිය 103:3 | දෙවියන් වහන්සේ සාමය හා සුවයේ වරප්‍රසාද දානය කරන බව. |
| යාච්ඤාව | ගීතාවලිය 29,59 | දෙවියන් වහන්සේගේ බලය තුළ ආත්ම විශ්වාසයෙන් යාච්ඤා කරයි. | ගීතා 27:1<br>ගීතා 46:1<br>ගීතා 150:6 | විශ්වාසය හා ධෛර්ය දිරිමත් කරයි. |



# 6 ශ්‍රේණිය - දෙවියන් වහන්සේ විමුක්තිදායකයාණෝය

## 1. පොදු අරමුණු

- ❖ දරුවන්ට දෙවියන් වහන්සේ තම ජනතාව වහල්බවින් පාපයෙන් හා බියෙන් නිදහස් කරන විමුක්තිදායකයාණන් බව සොයාගැනීමට උදව් කරයි.
- ❖ පැරනි ගිවිසුමෙහි නික්මයාම සිදුවීම තුළ හා නව ගිවිසුමේ ජේසුස් වහන්සේ නව මෝසෙස් ලෙස සම්බන්ධ කරයි.
- ❖ පාපයෙන් මිදීම සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය බව තේරුම් ගනියි.
- ❖ මිදීමේ බයිබලීය ගීතිකාවන් හා ගීතාවලිය තුළින් දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමට ඉගැන්වීම.

## 2. ධර්මෝපදේශයේ මූලික කුළුනු හතරට අනුව

**I.** ශුද්ධ ලියවිල්ල - දේව වචනය

**පැරණි ගිවිසුම**

1. ජෝශප්ගේ කථාව (උත්පත්ති 37 හා 45-47)
   ජෝශප් මුහුණ දුන් ගැටළු/ සමාව දීම/ දිව්‍ය සංරක්ෂණය
2. නික්මයාම
   වසංගත 10 (නික්මයාම 7-12)
   පාස්කු මංගල්‍යය (නික්මයාම 12)
   දස පණත (නික්මයාම 20)



**නව ගිවිසුම**

1. ''නව මෝසෙස්'' ලෙස ජේසුස් වහන්සේ
   ජොහාන් 1:21,25,45
   ක්‍රියා 3: 22-26, 7:37
2. මංගල වාක්‍ය
   මතෙව් 5

**ඉගෙනුම් ඵල**

- ■ ජෝශප්ගේ කථාව හා නික්මයාම සිද්ධීන් පැහැදිලි කරයි.
- ■ ජේසුස් වහන්සේ නව මෝසෙස් බව පැහැදිලි කරයි.
- ■ භාග්‍ය අට ප්‍රේමයේ නීතිය ලෙස ප්‍රකාශ කරයි.

**II.** ඇදහිල්ලේ ප්‍රකාශන - විශ්වාස ලක්ෂණය



**අන්තර්ගතය**

- ■ අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය 3,4,5 වගන්ති
- ■ නිසියානු විශ්වාස ලක්ෂණය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ හා ගැලවීම අතර ඇති මූලික සත්‍යතාවයන් කෙරෙහි අවධානය යොමු කරයි.

**ඉගෙනුම් ඵල**

- ■ අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණයේ 3 හා 5 ද ඊට අදාළ නිසියානු විශ්වාස ලක්ෂණයේ වගන්ති ද නැවත මතකයට නඟයි.
- ■ ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීම සමඟ ඉතිහාසය දෙවියන් වහන්සේගේ මිදීම සම්බන්ධ කරයි.

## III. සක්‍රමේන්තු - ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවිතය

අන්තර්ගතය - පාපොච්චාරණය (ජොහන් 20:23)



**ඉගෙනුම් ඵල**

- පාපොච්චාරණය තුළින් පාපයෙන් ගැලවීම හා නව ජීවිත ආරම්භයක් අත්දකියි.
- විමුක්තියේ හා සාමයේ ත්‍යාගයක් ලෙස දේව කරුණාව හඳුනාගනියි.

## IV. යාච්ඤාව - ප්‍රශංසාව හා ස්තුති කිරීම

**අන්තර්ගතය**

- ගීතාවලිය 135 - දෙවියන් වහන්සේගේ මිදීමේ විශ්මිත ක්‍රියා
- නික්මයාම 15 - රතු මුහුද තරණය කිරීමෙන් පසු මෝසෙස්ගේ ගීතය

**ඉගෙනුම් ඵල**

- ප්‍රීතියෙන් හා විශ්වාසයෙන් යුතුව තෝරාගත් වගන්ති උච්චාරණය කරයි.
- නිදහස හා සමාව ලැබීම සඳහා දෙවියන් වහන්සේට ස්තුති කර කෙටි යාච්ඤාවක් නිර්මාණය කරයි.

## 03. ඉගෙනුම් හා ඉගැන්වීම් යෝජනා

- කථාන්දර කීම - ජෝශප්ගේ කථාව, නික්මයාම සිදුවීම, කන්ද උඩ දේශනාව
- දෘශ්‍යාධාර - නික්මයාමේ ගමනේ සිතියමල මෝසෙස් හා ජේසුස් වහන්සේ සංසන්දනාත්මක කර ඇති චාට්
- රංගනය සමඟ ගායනය - නික්මයාම 15 ගීතය, ගීතාවලිය 135
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
    - රතු මුහුද තරනය චිත්‍රයට නැඟීම
    - පෞද්ගලිකව විමුක්තිය පිලිබඳ කෙටි යාච්ඤාවක් නිර්මාණය කිරීම
    - ජෝශප් තම සහෝදරයාට සමාව දීමේ අවස්ථාව භූමිකා රංගන ආකාරයෙන් ඉදිරිපත් කිරීම

## 04. තක්සේරුව හා ඇගයීම

| අංශය | වර්ගය | ලකුණු |
|---|---|---|
| ලිඛිත | බහුවරණ ප්‍රශ්න, හිස්තැන් පිරවීම, කෙටි පිළිතුරු සැපයීම | 40 |
| කටපාඩම් පද | ගීතාවලිය 135 හෝ විශ්වාස ලක්ෂණයේ වගන්ති | 20 |
| කථික හෝ චිත්‍ර | නික්මයාමේ සිද්ධි ජෝශප්ගේ කථාව | 20 |
| අවබෝධය | වාචික ප්‍රශ්න ඇසීම | 20 |

## සම්මාන ප්‍රධානය කිරීම

- රන් — 85–100
- රිදී — 70–84
- ලෝකඩ — 50–69
- සහතික් පත්‍ර — 50 අඩු

### 05. 6 ශ්‍රේණිය අවසානයේ දී අපේක්ෂිත ප්‍රතිඵල

- පැරණි හා නව ගිවිසුම තුළ විමුක්තිදායකයාණන් ලෙස දෙවියන් වහන්සේ ගැන ගැඹුරු අවබෝධයක් ලබා ගනියි.
- අපව පාපයෙන් ගලවන නව මෝසෙස් ලෙස ජේසුස් වහන්සේව පිළිගනියි.
- නිසියානු විශ්වාස ලක්ෂණයේ හා නිසියානු විශ්වාස ලක්ෂණයේ වගන්ති හා සමීප වෙයි.
- ගීතාවලිය හා බයිබලයේ ගීත අනුව යාච්ඤාවට හා ප්‍රශංසාවට ආදරය කරයි.

## 6 ශ්‍රේණිය සඳහා අමතර බයිබල් පාඨ

### I. ශුද්ධ ලියවිල්ල - දේව වචනය

(ප්‍රධාන පාඨ -: ජෝශප්ගේ කථාව, නික්මයාම සිද්ධීන්, කන්ද උඩ දේශනාව)

**1. නික්මයාම 14:14**

''උන්වහන්සේ ඔබ උදෙසා සටන් කරන සේක. ඔබ නිශ්චලව සිටිය යුතුය.'' යි කීය.

**2. නික්මයාම 6:7**

''තවද මාගේම සෙනඟ මෙන් නුඹලා භාරගෙන මම නුඹලාගේ දෙවියන් වහන්සේ වන්නෙමි. මෙසේ මම මිසරවරුන්ගේ බර වැඩවලින් නුඹලා මුදන නුඹලාගේ දෙවි සමිඳාණන් මා බව නුඹලා එවිට දැනගන්නහුය.''

**3. මතෙව් 5:7**

''දයාවන්තයෝ භාග්‍යවන්තයෝය. ඔවුහු දයාව ලබන්නහුය.''

**4. ජොහාන් 8:36**

''එබැවින් පුත්‍රයාණෝ ඔබ නිදහස් කරන සේක් නම් ඔබ සැබැවින්ම නිදහස්ය.''

**හේතුව** : මේවා දෙවියන් වහන්සේගේ විමුක්තිය පිළිබඳ පොරොන්දුවයි. උන්වහන්සේගේ සැලකිල්ල හා ක්‍රිස්තුන් වහන්සේ තුළ ප්‍රේමයේ නව නීතිය ඉස්මතු කරයි.

### II. විශ්වාස ලක්ෂනය

(ප්‍රධාන පාඨ : අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂනය 3 හා 5 පාඨ, නිසියානු විශ්වාස ලක්ෂනය)

**1. 1 කොරින්ති 6:14**

''දෙවියන් වහන්සේ සමිඳාණන් වහන්සේ මරණයෙන් උත්ථාන කළ සේක. ස්වකීය බලයෙන් අපත් උන් වහන්සේ එසේ උත්ථාන කරන සේක.''

**2. මතෙව් 28:6**

''උන්වහන්සේ මෙහි නැත. උන්වහන්සේ වදාළ ලෙස ම උත්ථාන වූ සේක. එන්න සමිඳාණන් වහන්සේ තැන්පත් කළ ස්ථානය බලා''

**3. පිලිප්පි 3:20**

''එහෙත් අපි ස්වර්ගයේ පුරවැසියෝ වම්හ අප ගළවන පිණිස ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ගයෙන් වඩින තෙක් අපි බලා සිටිමු.''

**හේතුව** : ස්වාමින් වහන්සේගේ උත්ථානයත් සදාතන ජීවිතයත්, පාපයෙන් මිදීම හා ක්‍රිස්තුස් වහන්සේගේ බලා පොරොත්තුව සමඟ සම්බන්ධ කරයි.

### III. සක්‍රමේන්තු - පාපොච්චාරණය

(ප්‍රධාන පාඨය : ජොහාන් 20:23)

**1. යෙසායා 1: 18**

''ජෙරුසලම වනාහි මිදි වත්තක මඩුවක් මෙන්ද කැකිරි වත්තක පැල්පතක් මෙන් ද ආරක්ෂා රහිත වූ වටලනු ලැබූ නගරයක් මෙන්ද යන්තමින් ඉතිරි වී ඇත.''

**2. ක්‍රියා 3: 19**

''ඔහු ඇවිදිනවාත් දෙවියන් වහන්සේට ප්‍රශංසා කරනවාත් සියලු දෙනා දුටුවෝය.''

**3.ගීතාවලිය 145: 8**

''සමිඳාණෝ දයාවන්තය අනුකම්පාවෙන් පූර්ණ ය වහා නොකිපෙන සුළුය තිරසර පෙමින් යුතුය.''

**හේතුව** : දේව කරුණාව හා සමාව පාපයෙන් මිදීම ලෙස පෙන්වා දෙයි.

## IV. යාච්ඤාව

ප්‍රධාන පාඨ : ගීතාවලිය 135, නික්මයාම 15

**1. ගීතාවලිය 136: 1**

''සමිඳුන් හට තුති පුදන්න එතුමාණෝ යහපත්ය එතුමන්ගේ තිර පෙම සදහටම පවත්නේය ''

**2. නික්මයාම 15: 2**

''සමිඳාණෝ, මා සවිය හා ගීතය වෙති; එතුමාණෝ මා විමුක්තිය වෙති; මාගේ දෙවිඳාණෝය. මා දෙවිතුමන් මම පසසමි. මා පියාගේ දෙවිඳුන් මහිමයට පමුණුවමි. ''

**3. ගීතාවලිය 150: 6**

''ජීවමාන සියල්ලෝ සමිඳුන් පසසත්වා; සමිඳුන්ට ප්‍රශංසා වේවා;

**හේතුව**: මෙම යාච්ඤාවන් දෙවියන් වහන්සේගේ මිදීමේ බලය කෘතඥතාවය/ වන්දනාව හා ප්‍රශංසාව දක්වන ආකාරය ඉස්මතුකර දක්වයි.

## මෙම පද භාවිත කළ හැකි ආකාරය

- මතක තබා ගැනීමේ කාර්යය : ප්‍රධාන පාඨ වලට අමතරව සතියකට එක් අමතර පාඨයක්

- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් : දරුවන්ට තමන් කැමති පාඨයක් ඔවුන් කැමති ආකාරයට ලිවීම හෝ විස්තර කිරීම.

- ප්‍රශ්නාවලිය සැකසීම : ප්‍රධාන තේමාව හා පාඨයන් මූලික කරගනිමින් කෙටි ප්‍රශ්න නිර්මානය කිරීම.

- යාච්ඤා වේලාව : දහම් පාසල ආරම්භයේ දී හෝ අවසානයේ එම යාච්ඤා භාවිතා කරන්න.

# 7 ශ්‍රේණිය - දෙවියන් වහන්සේ විමුක්තිදායකයාණෝය

## 1. පොදු අරමුණු

- ❖ දිවැසිවරුන් හා සමිදාණන් වහන්සේ දේව සේවය තුළ දෙවියන් වහන්සේගේ මිදීමේ බලය පිලිබඳ අවබෝධය ගැඹුරු කරයි.
- ❖ මිදීම, අධ්‍යාත්මික සුවය, සමාවදීම සහ ක්‍රිස්තුන් වහන්සේ තුළ ගැලවීම සමඟ සම්බන්ධ කරයි.
- ❖ රෝගීන් ආලේප කිරීමේ සක්‍රමේන්තුව දෙවියන් වහන්සේගේ සුව කිරීමේ ස්පර්ශය ලෙස අගය කරයි.
- ❖ ප්‍රශංසාවේ සහ සමාව යැදීමේ ගීතිකා තුළින් යාච්ඤාපූර්වක විශ්වාසය වර්ධනය කරගනියි.

## 2. ධර්මෝපදේශයේ කුළුනු හතරට අනුව

**I**. ශුද්ධ ලියවිල්ල - දේව වචනය




**පැරණි ගිවිසුම** - දිවැසිවරුන් හරහා විමුක්තිදායකයාණන් ලෙස දෙවියන් වහන්සේ

- යෙසායා 61:1-2, 14:1-2
- ජෙරමියා 29:14, 31:33-34
- එසකියෙල් 34:22, 37:12-14
- දානියෙල් 2:44, 6:27

**නව ගිවිසුම** - ක්‍රිස්තුස් වහන්සේ තුළ සම්පූර්ණවීම

- ලූක් 4:18-20 - සමිදාණන් වහන්සේ ප්‍රසාද ලත් වසර ප්‍රකාශයට පත් කිරීම
- ජේසුස් වහන්සේගේ දූත කාර්යය
  - ලාදුරු රෝගියෙකු සුව කිරීම (මාක් 1:40-45)
  - ගෙරසීන් රටේ අශුද්ධාත්ම ආවේශ වූවෙකු සුව කිරීම (මාක් 5:1-20)
  - සමාරිය ස්ත්‍රිය (ජොහාන් 4:5-30)
  - සකේවුස් (ලූක් 19:1-10)

**ඉගෙනුම් ඵල**

- දරුවන්ට මිදීම පිළිබඳ අනාවැකි සහා ඒවා ජේසුස් වහන්සේ තුළ ඉටුවීම නැවත මතකයට නගයි.
- ජේසුස් වහන්සේගේ දූත කාර්යය තුළ හමුවන සුවකිරීමේ හා සිත්හැරීමේ කතාන්දර ඉදිරිපත් කරයි.
- පාපයෙන් රෝගයේන හා බියෙන් අපව මුදවා ගන්නා තැනැත්තා ලෙස ජේසුස් වහන්සේව හදුනාගනියි.

### II. ඇදහිල්ල හා විශ්වාසයේ ප්‍රකාශන

**අන්තර්ගතය** - අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය

- 3 වන පාඨය: ''ශුද්ධාත්මයාණන් විසින් පිළිසිඳ ගත් කන්‍යා මරියතුමියගෙන් උපත ලැබූවේය.''
- 4 වන පාඨය: ''පෝන්සියෝ පිලාත් යටතේ දුක් විඳ කුරුසියේ ඇන ගසා උකුත් වී තැන්පත් කරන ලදී.''
- 5 වන පාඨය : ''පාතාලයට බැස තුන්වනදා මළවුන් කෙරෙන් උත්ථාන කර වදාරා පරමණ්ඩලයට නැග සර්ව වල්ලභ වූ දෙවි පියාණන්ගේ දකුණු පාර්ශවයේ වැඩ සිටින්නාහ.''

**ඉගෙනුම් ඵල**

- මෙම වගන්ති මතකයේ තබා ගනිමින් සරල වචන වලින් පැහැදිලි කරයි.
- සමිදාණන් වහන්සේගේ ජීවිතය මරණය හා උත්ථානය මිදීමේ කේන්ද්‍රස්ථානය ලෙස දකියි.

### III. සක්‍රමේන්තු - ජේසුස් වහන්සේ තුළ ජීවිතය

**අන්තර්ගතය** - රෝගීන්ගේ ආලේපය

- මාක් 6:13 - ''තවද ඔවුහු බොහෝ දුෂ්ඨාත්මයන් දුරුකොට බොහෝ රෝගීන්ද තෙලින් ආලේප කොට සුවපත් කළහ.''
- ජාකොබ් 5:14-15 - ''ඔබ අතරෙන් යමෙක් රෝගීව සිටීනම් ඔහු සභා මූලිකයන් කැඳවා ගනීවා. ඒ මූලකයෝ සමිදාණන් වහන්සේගේ නාමයෙන් ඔහු තෙලින් ..... ඔහු උදෙසා යාච්ඤා කරත්වා.''

**ඉගෙනුම් ඵල**

- රෝගින්ගේ ආලේපය දෙවියන් වහන්සේගේ සුවකිරීමේ සක්‍රමේන්තුව ලෙස තේරුම් ගනියි.
- එය රෝගීන්ට ශක්තිය, සාමය හා බලාපොරොත්තුව ලබාගැනීමට හැකි සක්‍රමේන්තුව ලෙස දකියි.



## VI. යාච්ඤාව - ප්‍රශංසාව හා විශ්වාසය

**අන්තර්ගතය -**

ගීතාවලිය 29 - දෙවියන් වහන්සේගේ හඬ බලයෙන් හා තේජසින් පිරී ඇත.

ගීතාවලිය 59 - දෙවියන් වහන්සේගේ ආරක්ෂාව හා ගැලවීම පතා යැදුම

**ඉගෙනුම් ඵල**

- දෙවියන් වහන්සේගේ බලය හා දේව ආරක්ෂාව වෙනුවෙන් උන්වහන්සේට ප්‍රශංසා කිරීමට ඉගෙන ගනියි.
- ගීතාවලිය 29 හා 59 හි තෝරාගත් පද අර්ථය සහිතව උච්චාරණය කරයි.

## 3. ඉගෙනුම් හා ඉගැන්වීම් යෝජනා

- කථාන්දර ක්‍රමය : දිවැසිවර පණිවිඩ/සුවකිරීමේ ප්‍රාතිහාර්යන්/සකේවුස්ගේ සිත් හැරීම
- දෘශ්‍යාධාර : දිවැස්වැකි ඉටුවීම පිළිබඳ පෝස්ටර් ප්‍රාතිහාර්ය ගැන පෝස්ටර්
- රංගනය සමඟ ගීත ගායනය : විමුක්තියේ හා සුවකිරීමේ ගීතිකා
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් :
  - ජේසුස් වහන්සේ රෝගීන් සුව කළ අවස්ථා චිත්‍රයට නැගීම.
  - ගීතාවලිය පදනම් කරගෙන පෞද්ගලිකව යාච්ඤා ලිවීම.
  - සකේවුස් හෝ සමරියා ස්ත්‍රිය ජේසුස් වහන්සේව හමුවීම භූමිකා රංගනයෙන් ඉදිරිපත් කිරීම.

## 04. තක්සේරුව හා ඇගයීම

| අංශය | වර්ගය | ලකුණු |
|---|---|---|
| ලිඛිත | බහුවරණ ප්‍රශ්න, හිස්තැන් පිරවීම, කෙටි පිළිතුරු | 40 |
| කටපාඩම් පද | ගීතාවලිය 29 හෝ 59 හි පද | 20 |
| කථික හෝ චිත්‍ර | දිවැස්වැකි ඉටුවීම හෝ සුවකිරීමේ කථාන්දර | 20 |
| අවබෝධය | සුවකිරීමේ හා විමුක්තියේ කෙටි වාචික ප්‍රශ්න | 20 |

**සම්මාන මට්ටම**

| | |
|---|---|
| • රන් | 85–100 |
| • රිදී | 70–84 |
| • ලෝකඩ | 50–69 |
| • සහතික පත්‍ර | 50 අඩු |

## 05. 7 ශ්‍රේණිය අවසානයේ දී අපේක්ෂිත ප්‍රතිපල

- විමුක්තිය පිළිබඳ දිවැස්වැකි හා ජේසුස් වහන්සේගේ සුවකිරීමේ සේවය පිළිබඳ සමීපභාවය.
- ගැලවීමේ මූලාශ්‍ර ලෙස ජේසුස් වහන්සේගේ මරණය සහ නැවත නැගිටීම අවබෝධ කර ගැනීම.
- සුවකිරීමේ සක්‍රමේන්තුව ලෙස රෝගීන්ගේ ආලේප කිරීම පිළිබඳ මූලික දැනුම.
- ගීතාවලියේ විමුක්තියේ ගීත භාවිතා කරමින් යාච්ඤාවේ හා ප්‍රශංසාවේ අත්දැකීම් ලබාගනියි.

# 7 ශ්‍රේණිය සඳහා අමතර බයිබල් පාඨ

## I. ශුද්ධ ලියවිල්ල - දේව වචනය

**ප්‍රධාන පාඨ**

- දිවැසිවරුන් - යෙසායා 61:1-2, 14:1-2/ජෙරමියා 29:14, 31:33-34/ එසකියෙල් 34:22, 37:12-14/ දානියෙල් 2:44, 6:27
- ඉටුවීම - ලූක් 4:18-20
- ජේසුස් වහන්සේගේ දූත සේවය : මාක් 1:40-45, 5:1-20 / ජොහාන් 4:5-30 / ලූක් 19:1-10

**අමතර පාඨ**

- ''ඔහු මට අයදින්නේ නම් මම පිළිතුරු දෙන්නෙමි.'' - ගීතාවලිය 91:15
- ''සමිදාණෝ පීඩා විඳින්නන්ට යුක්තිය ඉටු කර දෙන සේක. සාගිනිවූවන්ට අහාර දෙන සේක.'' - ගීතා 146:7
- ''ක්‍රිස්තුස් වහන්සේ අප මුදාගත්තේ නිදහස්කම ඇතිව සිටීමටය. එබැවින් දාසකම නමැති වියගසට නැවත යටත් නොවේ. ස්ථිරව සිටින්න.'' - ගලාති 5:1

❖ ඉහත පාඨ ඔවුන් ක්‍රිස්තුස් වහන්සේ තුල නිදහස, ආරක්ෂාව **හා නව ජීවිතය ලබා දීමේ** දෙවියන් වහන්සේගේ බලය පෙන්වාදෙයි.

## II. ඇදහිල්ල

**ප්‍රධාන පාඨ**

- අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණයේ 3,4,5 වගන්ති

**අමතර පාඨ**

- ''මා ඔබට භාර දුන්නේ මා ලබාගත් දෙයම බව ප්‍රධාන කොට කිව යුතුය. එනම් ශුද්ධ ලියවිල්ල ප්‍රකාර ක්‍රිස්තුන් වහන්සේ අපගේ පාප උදෙසා මළ බවත් වළලනු ලැබූ බවත් ශුද්ධ ලියවිලි ප්‍රකාර තුන්වනදා උත්ථාන කරනු ලැබූ බවත්'' - 1 කොරින්ති 15:3-4
- ''ජේසුස් වහන්සේ කථා කරමින් පුනර්ජීවනය ද ජීවනය ද මම වෙමි. මා අදහා ගන්නා මැරුණත් ජීවත් වහන්නේය.'' - ජොහාන් 11:25
- ''එහෙත් දෙවියන් වහන්සේ මරණ බන්ධනයෙන් උන්වහන්සේ මුදා උත්ථාන කර වදාල සේක. මන්ද මරණයට උන්වහන්සේ බැඳ තබාගත නොහැකි විය.'' - ක්‍රියා 2:24

❖ විශ්වාස ලක්ෂණයේ වගන්ති දේව වචනයේ ජීවිතයේ බලාපොරොත්තුවේ හා පෙරොන්දු වලට දරුවන් සම්බන්ධ කිරීමට උදව් වෙයි.

## III. සක්‍රමේන්තු - ජේසුස් වහන්සේ තුළ ජීවිතය

**ප්‍රධාන පාඨ**

- රෝගීන්ගේ ආලේපය : මාක් 6:13 හා ජාකොබ් 5:14-15

**අමතර පාඨ**

- ''ඇදහිල්ලේ යාච්ඤාව රෝගීන් ගලවයි. ස්වාමීන් වහන්සේ ඔවුන් නැඟිටවන සේක. එවිට ඇදහිල්ලෙන් පුදන යාච්ඤාවෙන් රෝගියාට සුවය ලැබේ.'' - ජාකොබ් 5:15
- ''නුඹලාට සුවය ගෙනෙන ස්වාමීන් වහන්සේ මමය.'' - නික්මයාම 15:26
- ''වෙහෙසවන බරඋසුලන සියල්ලෙනි මම ඔබට සහනය දෙමි.'' - මතෙව් 11:28

❖ දෙවියන් වහන්සේගේ සුවදානීය වැඩසිටීම හා දුක් විඳින්නන් සඳහා කරුණාව ඉස්මතු කරයි.

## IV. යාච්ඤාව - ප්‍රශංසාව හා විශ්වාසය

ප්‍රධාන තේමාව

- ගීතාවලිය 29 හා 59

අමතර පාඨ

- ''හිමිසඳ මාගේ ආලෝකය හා විමුක්තියය. මම කිසිවෙකුට බිය නොවෙමි. හිමි සඳ මාගේ ජීව ශක්තියය. මට හිතයක් නැත.'' - ගීතාවලිය 27:1
- ''දෙවිඳාණෝ අපේ ශක්තිය හා සරණ වන සේක. හැමදා විපතේ දී අපහට පිළිසරණක් වන සේක.'' - ගීතාවලිය 46:1
- ''ජීවමාන සියල්ලෝ සමිඳුන් පසසත්වා, සමිඳුන්ට ප්‍රශංසා වේවා.'' - ගීතාවලිය 150:6

❖ ඉහත පාඨ විමුක්තිදායක දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමට හා විශ්වාසයෙන් යුතුව යාච්ඤා කිරීමට ඔවුන් දරුවන්ට ආරාධනා කරයි.

### මෙම උපුටා දැක්වීම් භාවිතා කරන්නේ කෙසේද?

- සතියකට එක් කටපාඩම් පදයක් - ඕනෑම කොටසකින්
- යාච්ඤා වේලාව - පන්තිය ආරම්භයේ හෝ අවසානයේ දී අදාල පාඨ මුල්කරගනිමින්
- චිත්‍ර හා නාට්‍ය - මෙම පාඨයන් වල අදහස දෙන ආකාරයට චිත්‍රයක් ඇඳීම හෝ රංගනයේ යෙදීම
- ප්‍රශ්න කොටස - කෙටි හිස්තැන් පිරවීම හා කව්රුන් විසින් කා හටද යන්න (අවස්ථා සම්බන්ධය)

### අමතර පාඨ ඇතුලත් කිරීමෙන් ලැබෙන වාසි

1. දේව වචනය ඇදහිල්ල සක්‍රමේන්තු හා යාච්ඤාව යන සියලු අංශ එකම තේමාවනට සම්බන්ධ කරයි.
2. ප්‍රධාන පාඨ වලට වඩා අධ්‍යාත්මික නැඹුරුවක් ලබා දෙයි.
3. ගුරුවරුන් හා සිසුන් සඳහා නම්‍යශිලී ඉගෙනුම් උපකරන සපයයි.
4. ප්‍රශ්න සූදානම් කිරීම කටපාඩම් පද හැදෑරීම් වැනි දේට වඩා අවබෝධයකින් (යථාර්ථයෙන්ම) සහභාගීවීමක් හා යාච්ඤාවට නැඹුරුවක් ඇති අයුරින් සිදු වේ.
5. මෙම දනුම මිනුම තරඟය සඳහා සූදානම හුදෙක් වචන පාඩම් කිරීමකට එහා ගිය ක්‍රියාකාරී සහභාගීකමේ හා යාච්ඤාශීලී ක්‍රියාදාමයක් බවට පත්කර ගැනීමට හැකියාවක ලැබීම.